WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II
சிங்களமொழியும் இலக்கியமும் I, II
Sinhala Language and Literature I, II

2019.12.03 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.
(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

**1.** ඔවුන් දෙදෙනා වැඩ කළේ **දීමෙන් දීව ගා ගෙන** ය.
(1) ඥාතීන් මෙන් ය. (2) හැම විට ම එක තැන සිට ය.
(3) ඉතා මිත්‍රශීලී ව ය. (4) දිව් එකිනෙක ස්පර්ශ කරමින් ය.

**2.** පාලකයන් සමග කටයුතු කළ යුත්තේ **දැලි පිහියෙන් කිරි කන්නා සේ** ය.
(1) ඉතා පරෙස්සමිනි. (2) කැපෙනවාට බියෙනි.
(3) දුරින් සිටිමිනි. (4) ඇඟෑලුම්කම් පාමිනි.

**3.** අක්කාගේ විවාහය ප්‍රමාද වූයේ අම්මා **වංසෙ කබල් ගෑ නිසා** ය.
(1) තම පරම්පරාව ගැන කියූ නිසා (2) තමා ගැන පුරසාරම් කියූ නිසා
(3) මනාල පාර්ශ්වයේ අඩුපාඩු කියූ නිසා (4) තම පරම්පරාව ගැන පුරසාරම් කියූ නිසා

● අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

**4.** වර්තමාන ශිෂ්‍ය පරම්පරාව වෙතින් කෙමෙන් කෙමෙන් ආත්ම .............................. ඉවත් වනු පෙනෙයි.
(1) අධීක්ෂණය (2) ශික්ෂණය (3) සමීක්ෂණය (4) හිංසනය

**5.** විවාද කණ්ඩායමේ නායකයා තම කරුණු .............................. ඔප්පු කළේ ය.
(1) තර්කානුකූල ව (2) නීත්‍යනුකූල ව (3) ධර්මානුකූල ව (4) ආගමානුකූල ව

**6.** අන්ධ විශ්වාසවල එල්බ සිටින්නෝ තම .............................. පාවා දෙති.
(1) ආත්මය (2) දෛවය (3) බුද්ධිය (4) ධනය

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

7. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
   (1) උල්ලංඝණය, පරිණාමය, පිළිරුව, සංස්කරනය
   (2) දොල, මකුළුවා, මේසකුය, රක්තාණු
   (3) රණසූර, සම්භාෂණය, හෙලටුවා, ක්ෂේමභූමි
   (4) ස්වේච්ඡා, මිණිමුතු, අදූරදර්ශී, කෙණ්ඩිය

8. 'කතුර, සවිය, ප්‍රවීණ, මහාචාර්ය' යන වචනවල **දෙවෙනි අකුරෙහි** අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
   (1) කෙටි පාපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, කෙටි ඉස්පිල්ල හා ඇලපිල්ල
   (2) කෙටි ඉස්පිල්ල, කෙටි පාපිල්ල, ඇලපිල්ල හා දීර්ඝ ඉස්පිල්ල
   (3) කෙටි පාපිල්ල, ඇලපිල්ල, කෙටි ඉස්පිල්ල හා දීර්ඝ ඉස්පිල්ල
   (4) කෙටි පාපිල්ල, කෙටි ඉස්පිල්ල, දීර්ඝ ඉස්පිල්ල හා ඇලපිල්ල

9. 'කහ' යන පදයෙහි අන්තර්ගත අක්ෂර වර්ගය වන්නේ,
   (1) තාලුජ ය. (2) කණ්ඨජ ය. (3) දන්තජ ය. (4) මූර්ධජ ය.

10. අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පේළිය තෝරන්න.
   (1) කව්සිළුමිණ, ගුත්තිලය, සියබස්ලකර, සුභාෂිතය
   (2) කෝකිලය, පරෙවිය, සැළලිහිණිය, ගිරාව
   (3) මුවදෙව්දාවත, සසදාවත, මයූරය, තිසරය
   (4) යසෝදරාවත, වෙස්සන්තරය, කුසදාකව, දහම්සොඬදාකව

11. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
   (1) පුතෙක්, ඇතකු, දෙවියන්, ඌරෝ
   (2) නායකයකු, ධනවතුන්, මා, කාන්තාවක
   (3) සිංහයකු, හාවෙක්, සර්පයන්, වංශවතෙක්
   (4) කුරුල්ලෙක්, ධනවතකු, මහල්ලෙක්, වෙළෙන්දෝ

12. "නළුනිළියෝ නාට්‍යාවසානයෙහි වේදිකාවෙන් ඉවත් ව ගියහ" යන වාක්‍යයේ '**වේදිකාවෙන්**' යන්නෙහි විභක්තිය කුමක් ද?
   (1) කර්ම (2) කරණ (3) ආධාර (4) අවධි

13. 'කැවුම්කිරිබත්' යන්න අයත් වන්නේ,
   (1) විභක්ති සමාසයට ය. (2) ද්වන්ද්වාර්ථ සමාසයට ය.
   (3) අන්‍යාර්ථ සමාසයට ය. (4) විශේෂණ සමාසයට ය.

14. 'සමාජ + ඊය' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
   (1) සමාජීය (2) සාමාජීය (3) සමාජයීය (4) සාමාජයීය

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.
   (1) සන්ධි - දකුණත, මැදැඟිල්ල, පත්තිරු, දැස
   (2) සමාස - ඉරහඳ, වනමල්, පන්සිල්, මුහුදුදිය,
   (3) මිශ්‍රක්‍රියා - බලමින්, කරමින්, ගොසින්, නටමින්
   (4) තද්ධිත - ධර්මිෂ්ඨ, ස්වර්ණමය, පාපතර, මධුරතම

16. **පූර්ව ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය කුමක් ද?
   (1) ශිෂ්‍යයා පොත් බලා රචනාවට කරුණු රැස් කළේ ය.
   (2) නිල් වලා පෙළ ආකාශයේ ඈතින් ඈතට ගමන් කළේ ය.
   (3) හෝර්ටන් තැනිතලා පෙදෙස සංවේදී පරිසර කලාපයකි.
   (4) ජීවිතය සම්පූර්ණ වීමට සාහිත්‍ය-කලා රස වින්දනය ද අවශ්‍ය ය.

● අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

17. **ප්‍රත්‍යුපකාර** කරන්නෝ අප සමාජයේ විරල ය.
   (1) බෙහෙවින් උපකාර (2) පරෝපකාර
   (3) නැවත උපකාර (4) නොකඩවා උපකාර

[තුන්වැනි පිටුව බලන්න.

WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**18.** සමහරු වැඩිහිටියන් කෙරෙහි **සානුකම්පික** වෙති.

(1) අනුකම්පා සහගත (2) අනුකම්පා විරහිත
(3) අනුකම්පා හරිත (4) අනුකම්පා පූර්වක

**19.** අපි රට ගොඩනැඟීමට **ඒකාබද්ධ ව** කටයුතු කරමු.

(1) එකා මෙන් එකට බැඳී (2) එකට ඇලී
(3) එකට බැඳී (4) එකාවන් ව නැඟී සිට

**20.** දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නොපවතින** පද පේළිය තෝරන්න.

(1) නඟුල, වියගහ, උදැල්ල, කමත
(2) පොත, පෑන, පැන්සල, අඩිකෝදුව
(3) පාපැදිය, යතුරුපැදිය, ගුවන්යානය, කෝච්චිය
(4) කෙටිකතාව, නවකතාව, පද්‍ය කාව්‍යය, උපහාරය

**21.** එක් එක් පද පේළියේ දී ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| (1) | ගවයා - වෘෂභ, | සිංහයා - බාසුරු, | ශාඛා - ගස | වනය - අරණ්‍යය |
| (2) | ගඟ - නදිය, | අම්මා - මව | අග්නි - ගිනි, | කුසුම - මල |
| (3) | ධර්මය - දහම, | බෙල්ල - ගෙල, | කේශ - කෙස්, | ලෝකය - භූමිය |
| (4) | සාගරය - මුහුද, | පොත - පුස්තකය, | කාන්තාව - මව, | වානර - වඳුරා |

**22.** මුලින් දී ඇති පදයට **සමානාර්ථයයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) සඳ - චන්ද්‍ර, සිසි, තරිඳු, නිශාකර (2) වතුර - ජලය, උදක, පැන්, දිය
(3) අත - බාහු, හස්ත, කර, අල්ල (4) පාර - වීථිය, මාර්ගය, මාවත, මග

**23.** **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.

(1) ආත්ම - අනාත්ම (2) හීන - නිහීන
(3) අභ්‍යන්තර - බාහිර (4) උතුර - දකුණ

**24.** **වැරදි** අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(1) 'ං' යන්න 'අනුස්වාර' නමින් ද හැඳින්වේ.
(2) 'මම' යන්නෙහි අනුක්ත පදය 'මා' යන්න යි.
(3) 'ගස' යන්න අප්‍රාණවාචී, ප්‍රථම පුරුෂ, ඒක වචන නාම පදයකි.
(4) 'පොල් + අත්ත' යන්න සන්ධි වනුයේ 'පොලත්ත' යනුවෙනි.

**25.** පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත, අර්ථාන්විත වාක්‍යය තෝරන්න.

(1) මහ මග වේගයෙන් දුව ගිය ඔහු පය පැකිලී බිම ඇද වැටුණේ ය.
(2) ගව සම්පත සුරැකීම උදෙසා ජාතික ආර්ථික වර්ධනය හේතු වෙයි.
(3) අනාගත දරුවන්ගේ අධ්‍යාපනය කරණ කොට ගෙන දෙමවුපියෝ බොහෝ වෙහෙසෙති.
(4) විද්‍යාඥයන් 21 වැනි සියවසේ අභිවෘද්ධිය පිණිස තාක්ෂණික උපකරණ නිර්මාණය කොට ඇත.

WWW.OLEVELAPI.COM

● අංක **26, 27** ප්‍රශ්න යටතේ දී ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

**26.** 'නිෂ්ඵල ක්‍රියාවක නිරත වීම'

(1) අබරා සිල් ගත්තා වාගේ (2) පරංගියා කෝට්ටෙ ගියා වාගේ
(3) අටුව කඩා පුටුව හදන්නා වාගේ (4) අන්දරේ සීනි කෑව වාගේ

**27.** 'වඩාත් උඩඟු වී ක්‍රියා කිරීම'

(1) පාළු ගෙයි වළං බිඳිනවා වාගේ
(2) අශ්වයාට අං ලැබුණා වාගේ
(3) අඟේ ඉඳන් කන කනවා වාගේ
(4) නැගපු ඉණිමගට පයින් ගහනව වාගේ

**28.** පූර්ව ස්වර ලෝප සන්ධියට හා ස්වර සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය වන්නේ,

(1) මුනිතුමා, මුලසුන (2) දකුණත, මුනිතුමා
(3) මුලසුන, මුනිතුමා (4) දකුණත, මුලසුන

[හතරවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

- අංක **29, 30** යටතේ දී ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

**29.** (1) අප ශිෂ්‍යයෝ වෙමු. (2) මේ පාසලෙහි බොහෝ ළමයි ඇත.
(3) ඔවුන් දක්ෂ ක්‍රීඩකයෝ වූ. (4) නායකයෝ අවංක විය යුතු ය.

**30.** (1) අප පාසලේ දරුවන් තරගයෙන් ජයග්‍රහණය කරාවි
(2) ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාව හෝ රචනාව ලියන්නේ ය.
(3) සුළඟින් බොහෝ ගස් පොළවට ඇද වැටුණහ.
(4) ලංකාවේ පළමු අගමැති නොහොත් ඩී. එස්. සේනානායක දක්ෂ පාලකයෙක් විය.

**31.**
- ජාතියට වැඩ කිරීම ............................ මම කැප වෙමි.
- ගුරුවරු දරුවන්ගේ අනාගතය ............................ බෙහෙවින් උනන්දු වෙති.
- දරුව, යාචකයකු ............................ මහ මග හිඟා නො කන්න.
- මේ ආපදා අවස්ථාවෙහි ............................ පියවර ගන්න.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?
(1) ගැන, පිණිස, වහා, මෙන් (2) නිසා, පිණිස, වහා, මෙන්
(3) පිණිස, ගැන, මෙන්, වහා (4) පිණිස, ගැන, මිස, වහා

**32.** පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"උන් මේ පැත්තට ආවේ නැහැ"
(1) ඔවුහු මේ දෙසට නො පැමිණියහ.
(2) ඔවුන් මේ දෙසට නො පැමිණියේ ය.
(3) ඔවුන් මේ දෙසට නො පැමිණියෝ ය.
(4) ඔවුහු මේ දෙසට නො පැමිණියේ ය.

**33.** 'තොරොක්කෝව' නම් කෙටිකතාවේ රචකයා වනුයේ,
(1) යසුනරි කවබත ය. (2) ගී ද මෝපසං ය.
(3) අකුතගාවා ය. (4) ඇන්ටන් චෙකොෆ් ය.

**34.** ශබ්ද ධ්වනිය වඩාත් ඉස්මතු වී පෙනෙන කවිපදය ඇතුළත් වරණය තෝරන්න.
(1) වෙරළ ඉඟිළ තුළ රළ වැළ ලෙස උලෙළ
(2) දුම්බර ලියෝ කර ඔසවා බලන බැලුම්
(3) සඳමඩල වසාගෙන කළු වලාකුළු ඇදිණ
(4) සුරිඳුනි කදිර පුර ලැබ දෙනු මැන පිහිට

**35.** "සවනක් ගන බුදුරැසින් මුළු ලොව සදමින් වඩුත් වඩුත් ...."
යන පාඨයෙහි 'සදමින්' යන්නෙහි අර්ථය කුමක් ද?
(1) වසමින් (2) සරසමින්
(3) විස්තර කරමින් (4) සකස් කරමින්

WWW.OLEVELAPI.COM

**36.** පහත සඳහන් කවියෙහි තුන්වැනි පදය තෝරන්න.

"මූණ රවා ගෙන ගොස් ගෙට වැදිලා
පූන නූල ඇද දමමින් බිඳලා
............................................
බාන ලෙසට අල්ලා ගෙන රවුළා"

(1) කුදේ ගැසී නැගිටින කල වෙවුලා
(2) ළඳේ නිසරු නො කරන් අප සියලා
(3) සොඳේ විඳින සැප විඳුමට මෙකලා
(4) යානේ උන් බමුණා බිම පෙරළා

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**37.** "ගස වතු සුදු
වී පිරිසුදු
පොහොය නැතුදු
සිල් ගත් බඳු"

ඉහත සඳහන් කවියේ රචකයා වනුයේ,

(1) කුමාරතුංග මුනිදාස ය. (2) මහගමසේකර ය.
(3) එස්. මහින්ද හිමි ය. (4) ආනන්ද රාජකරුණා ය.

**38.** හේන් ගොවිතැන ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ 'මහ එකා' යනු,

(1) පිඹුරා ය. (2) ලොකු පුතා ය.
(3) නයා ය. (4) අලියා ය.

**39.** "පෙරදිග ගොරහැඩි රකුසෝ
මගෙ ධ්‍යානය ඇයි කඩන්නේ
නිදා ගන්න පොරව ගත්ත
කළු රෙදි පොට
මොකට ද මේ
තීරුවලට ඉරා දමන්නෙ."

යන පද්‍ය ඛණ්ඩයෙන් කියැවෙන්නේ,

(1) රකුසකු ගැන ය. (2) රාත්‍රියක් ගැන ය.
(3) උදෑසනක් ගැන ය. (4) තවුසකු ගැන ය.

**40.** පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.
"මානවයාගේ තිබුණ ශක්‍යතා අතර එකක් තමයි භාෂා ශක්‍යතාව. ඒ කියන්නේ අදහස් ප්‍රකාශ කිරීම සඳහා ශබ්ද නිකුත් කිරීමේ හැකියාව."

(1) මනුෂ්‍යයා සතු හැකියාවක් වනුයේ භාෂා ශක්‍යතාව යි. ඉන් ගම්‍ය වනුයේ ශබ්ද නිකුත් කිරීමේ හැකියාව යි.
(2) මානවයා සතු ශක්‍යතාවක් වනුයේ භාෂා ශක්‍යතාව යි. ඉන් කියැවෙන්නේ අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව යි.
(3) මානවයා සතු සුවිශේෂ හැකියාවක් වනුයේ භාෂා ශක්‍යතාව යි. ඉන් අදහස් වනුයේ ශබ්ද උත්පාදනමය ශක්‍යතාව යි.
(4) මානවයා සතු හැකියාවන් අතර එකක් වනුයේ භාෂා ශක්‍යතාව යි. ඉන් කියවෙනුයේ අදහස් ප්‍රකාශනය සඳහා ශබ්ද උත්පාදනය කිරීමේ හැකියාව යි.

* *

WWW.OLEVELAPI.COM

[හයවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...